www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නව ආසියානු ව්‍යසනයක්: සුළි සුළඟ බුරුමයේ දස දහස් ගනනකගේ ජීවිත බිලි ගනී

## A new Asian disaster: cyclone kills tens of thousands in Burma

**කේ. රත්නායක විසිනි**
**2008 මැයි 7**

දරිද්‍රතාවයෙන් මිරිකී පවතින ආසියානු රටක් මත තවත් දැවැන්ත ඛේදවාචකයක් කඩා වැදී ඇත. නාර්ගිස් නම් වූ සර්ම කලාපීය සුළි සුළඟ සෙනසුරාදා බුරුමයේ බටහිර වෙරළබඩ ප්‍රදේශවලට කඩා වැදීමෙන් පසුව දස දහස් ගනනක් ජීවිතක්ෂයට පත්ව, තවත් බොහෝ ගනනක් අතුරුදහන්ව ලක්ෂ ගනනකට උන්හිටි තැන් අහිමි වී තිබේ. පැයට කිලෝ මීටර් 190ක් දක්වා වූ වේගයෙන් හැමූ සුළං සහ මීටර් 4ක් උසට ජල මට්ටම නැංවූ කුනාටුවක් නිවාස හා සෙසු ගොඩනැගිලි බිමට සමතලා කොට ප්‍රවාහන සබඳතා හා පනිවිඩ හුවමාරු සේවා බිඳ දමා දස ලක්ෂ ගනන් ජනයාට පිරිසිදු ජලය, ආහාර, වාසස්ථාන හා ඖෂධ අහිමි කලේ ය.

නිල මරන සංඛ්‍යාව වේගයෙන් ඉහල නගිමින් පවතින අතර ඊයේ රාත්‍රී වන විට එය 22,000 කරා ලඟා විය. තවත් 41,000ක් අතුරුදහන් වූවන් ලෙස සැලකෙයි. ගලවා ගැනීමේ කන්ඩායම් හා සහන සේවකයන් ව්‍යසනයට ලක් වූ ප්‍රදේශවලට ඇතුලු වෙමින් සිටින තතු යටතේ විනාශයේ පූර්න පරිමාව තවමත් එළිදරව් වී නැත. බුරුම මිලිටරි ජුන්ටාව රටෙන් පිටතට කාන්දු වී එන එන ප්‍රවෘත්ති සම්බන්ධයෙන් දැඩි පාලනයක් පවත්වා ගෙන යන අතර විපතට පත් ප්‍රදේශවලට ඇතුලු වීමට ජාත්‍යන්තර සහන කන්ඩායම්වලට අවසර දීමෙහි ලා මැලිකමක් දක්වයි.

වඩාත්ම විනාශයට ලක් වූ ප්‍රදේශය වන්නේ මිලියන 6ක ජනගහනයක් වාසය කරන්නේ යැයි තකසේරු කෙරෙන මුහුදු මට්ටමට පහලින් පවතින ඉරවඩි ඩෙල්ටාව යි. මිලියන 6.5ක ජනගහනයක් සහිත පැවති අගනුවර වන රැන්ගුන් නගරයට ද දරුනු ලෙස හානි සිදු වී තිබේ. අන්දමන් මුහුද හා මාර්ටබාන් බොක්ක අසල වෙරළබඩ කලාපය ඔස්සේ වූ වර්ග කිලෝමීටර් 30,000ක් භූමි ප්‍රදේශයක් පුරා කුනාටුවේ විනාශය සංකේන්ද්‍රනය වී ඇති අයුරු එක්සත් ජාතීන්ගේ චන්ද්‍රිකා ඡායාරූපයකින් පෙන්නුම් කෙරුනි. මෙය බුරුමයේ ගොඩබිමෙන් සියයට 5කට අඩු කලාපයක් වුවත් එම ප්‍රදේශයේ රටේ මිලියන 57ක ජනගහනයෙන් හතරෙන් එකකට ආසන්න ප්‍රමානයක් වාසය කරයි.

ඩෙල්ටාව තුල ගංගා හා ඇල මාර්ග එකිනෙක හරහා වැටී ඇත්තේ ප්‍රවාහනය හා පනිවිඩ හුවමාරුව අසීරු කරමිනි. බොහෝ ප්‍රදේශ කරා ලඟා විය හැක්කේ බෝට්ටු හෝ හෙලිකොප්ටර් මාර්ගයෙන් පමනි. දරුනුම ලෙස විපතට පත්ව ඇත්තේ දුප්පත් ජනයා ය. උන බම්බුවලින් තනා අතු හෝ ටකරන් සෙවිලි කල ඔවුන්ගේ කුඩා නිවාස ක්ෂනිකව සේදී ගොස් තිබේ.

බුරුම නිලධාරීන්ට අනුව, බොගලේ නගරයේ පමනක් 10,000ක් ජීවිතක්ෂයට පත්ව ඇත. හෙයිං ගියි දූපත්, පැතේන්, මියොංමා, ලපුටා, මව්ලම්නෙගියුන්, කියායික්ලට් හා පියාර්පොන් යන වෙරළ බඩ නගර ද විනාශයට ලක්ව තිබේ. ආන්ඩුව සුළි සුළඟට හසු වූ ප්‍රාන්ත පහ තුල හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කර ඇත.

සිය කන්ඩායම් "පහලින් වූ භූමිය මත භයංකර දර්ශන" දුටු බව රටට ඇතුලු වූ ප්‍රථම සහන සංවිධානය වූ වර්ල්ඩ් විෂන් ප්‍රන්ස ප්‍රවෘත්ති සේවයට පැවසී ය. වර්ල්ඩ් විෂන් උපදේශක කියි මින් මෙසේ ප්‍රකාශ කලේ යඃ "ඔවුන් හෙලිකොප්ටර්වල ඉඳන් මල සිරුරු දැක්කා, ඉතිං ඒක මහා විනාශයක් . . . ප්‍රවාහන බාධකවලට සම්පත්වල පවත්නා සීමිතකම එකතු වීම මගින් තත්වය සංකීර්න වී ඇති නිසා මේ විනාශයේ බලපෑම (2004 දෙසැම්බර් ආසියානු) සුනාමියට වඩා දරුනු වෙන්න පුලුවන්."

එක්සත් ජාතීන්ගේ සහන ප්‍රකාශක පෝල් රයිස්ලි මාධ්‍යවලට මෙසේ පැවසී යඃ "අපි බියට පත්වෙලා ඉන්නෙ ග්‍රාමීය ජනගහනයෙන් බොහෝ දෙනෙකුට පිටත ලෝකය එක්ක සබඳතා මුලුමනින් ම බිඳිලා තියෙන එක ගැන. සමහර ගම්මානවල වාසස්ථානවලින් සියයට 90ක් විනාශයට ලක් වෙලා, නැති නම් හානියට ලක් වෙලා. . . . විශාලම ගැටලුව නම් විපතට පත් ප්‍රදේශවලට ලඟා වීම යි. ද්‍රව්‍ය හා සේවාවන් සැපයීම පිලිබඳ දැවැන්ත ගැටලු පැන නගීවි. . . . ලොකුම උත්සුකතාව ජලයෙන් හට ගන්නා රෝග ගැනයි. ඒක නිසා ආරක්ෂාකාරී ජලය ලබා ගැනීම තීරනාත්මකයි. ඊලඟ දින කිහිපය තුල මඳුරු දැල්, උයන

පිහන උපකරන හා ඇඳුම් පැලඳුම්. ආහාරවලට හදිසි ප්‍රමුඛතාවක් නැහැ. ජලය හා වාසස්ථාන එහෙම නෙවි. “ මිලියනකට ආසන්න ජනයාට නිවාස අහිමිව තිබිය හැකි ය.

*ඇසෝසියේටට් ප්‍රෙස්* ප්‍රවෘත්ති සේවය රැන්ගුන් නගරයේ පවත්නා අවුල්වියවුල් තත්වය වාර්තා කලේ ය. “නගරවාසීහු ඉටිපන්දම් මිලදී ගැනීමට පෝලිම් ගැසී සිටියහ. කුනාටුව කඩා වැදීමෙන් පසුව ඒවායේ මිල ගනන් දෙගුන වී තිබේ. බොහෝ නිවාසවලට ජල සැපයුම අහිමිව ගොස් ඇත්තේ පානීය ජලය ලබා ගැනීමත් නගරයේ විල්වල ස්නානය කරනු පිනිසත් දිග පෝලිම්වල සිටීමට පවුල්වලට බල කරමිනි. බොහෝ රැහැන් දුරකතන සබඳතා සඳුදා අග භාගය වන විට පුනස්ථාපනය කොට තිබුනත් ජංගම දුරකතන හා අන්තර්ජාල සබඳතා බිඳ වැටී තිබුනි.”

රැන්ගුන් නුවර ආහාර හා ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ගනන් අහස උසට නගින බව වාර්තා වෙයි. නගරයෙන් අඩකට විදුලි බල සැපයුම ඒ වන විටත් අහිමි වී තිබුනි. පැට්‍රල් පිරවුම්හල් අසල දිගු පෝලිම් දක්නට ලැබුනි. ඊයේ රාත්‍රියේ එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩපිලිවෙල කියා සිටියේ අගනුවර තුල හා ඒ අසල ප්‍රදේශවල ව්‍යසනයෙන් විපතට පත් ජනයාට ආධාර බෙදා දීම තමන් ආරම්භ කොට තිබුනත් ගංවතුර හා මාර්ගවලට සිදු වී ඇති හානි නිසා බොහෝ වෙරලබඩ ප්‍රදේශවලට ලඟා විය නොහැකි බව යි.

## ජුන්ටා-විරෝධී ව්‍යාපාරය

“සිය ජනතාව රැක බලා ගැනීමට අසමත් වීම” සම්බන්ධයෙන් බුරුම ජුන්ටාවට දොස් පවරනු පිනිස බුෂ් පාලනාධිකාරය මෙම ව්‍යසනය ඩැහැ ගෙන තිබුනි. ජාත්‍යන්තර මාධ්‍ය ද මෙම ව්‍යාපාරයට එක් වී ඇත්තේ, ප්‍රමානවත් අනතුරු ඇඟවීමක් හා සූදානමක් නැති කම, ඔවුන්ගේ සහන මෙහෙයුම්වල අවුල් වියවුල් හා සීමිත ස්වභාවය සහ රටට සහන කන්ඩායම්වලට ඇතුලු වීමට ඉඩ දීමේ දී දක්වා ඇති ප්‍රමාදය සම්බන්ධයෙන් මිලිටරිය විවේචනය කරමිනි. මහජන වෛරය පිපිරී ගොස් ජුන්ටාව වැටෙනු ඇතැයි ද නැද්ද යන්න ගැන විවිධ අටුවාකරුවෝ සමපේක්ෂනය කරති. ඔවුන්ගේ මූලික උත්සුකතාව පවතින්නේ බුරුම ජනතාව ගැන නොව, මහ බලවතුන්ගේ විවිධ දේශපාලන න්‍යාය පත්‍රයන් ගැන ය.

දශක ගනනාවක් තිස්සේ යකඩ හස්තයකින් රට පාලනය කර ඇති බුරුම මිලිටරිය ව්‍යසනයේ පරිමාව සම්බන්ධයෙන් සැලකිය යුතු වගකීමක් දරන බවට කිසිදු සැකයක් නැත. එහි මූලික උත්සුකතාව වන්නේ, දරිද්‍රතාවයේ ගිලී සිටින ජනගහනයෙන් අති මහත් බහුතරයක වියදමින් සිය වරප්‍රසාදිත තත්වය පවත්වා ගෙන යාම යි. රටේ ඒක පුද්ගල ආදායම යන්තම් එ.ජ. ඩොලර් 1,250ක් වන අතර, ජීවිතාපේක්ෂාව වසර 61කි. අවුරුදු 5ට අඩු ලමුන්ගෙන් සියයට 32කට මන්දපෝෂනය බලපාන අතර ලඳරු මරන අනුපාතය 1000කට 75කි.

ඉන්දියානු කාලගුන විද්‍යා ඒජන්සිය සුලි සුලඟ කඩා වැදීමට පැය 48කට පෙර එහි බරැරුම්කම ද එහි අපේක්ෂිත ගමන් මග ද සම්බන්ධයෙන් බුරුම බලධාරින්ට අනතුරු ඇඟවී ය. රූපවාහිනිය හා ගුවන් විදුලිය මගින් කල් තියා කාලගුන වාර්තා නිකුත් කර තිබූ බව කියාපාමින් බුරුම රාජ්‍ය රූපවාහිනිය නිවේදනයක් නිකුත් කලේ ය. එහෙත් රූපවාහිනියට ප්‍රවිෂ්ටයක් නැති හා නිරන්තර විදුලි බල ඇනහිටීම්වලට මුහුන දෙන විපතට පත් ජනයාගෙන් බොහොමයක් වෙත එම අනතුරු ඇඟවීම් ලඟා වීමට ඉඩක් තිබිය නොහැක. බීබීසී ප්‍රවෘත්ති සේවයට අනුව, එක්සත් ජාතීන්ගේ ව්‍යසන පාලක ඒජන්සිය කියා සිටියේ කල් තියා අනතුරු ඇඟවීමේ මනා පද්ධතියක් නොතිබුනු බව ව්‍යසනයේ පරිමාව මගින් පෙන්නුම් කෙරෙන බව යි.

බුරුමය තුල මාධ්‍යවේදීන් හමුදාවේ සහන සේවාවන්ගේ සීමිත ස්වභාවය ද පසුගිය සැප්තැම්බරයේ දී ආන්ඩු-විරෝධී විරෝධතාවලට එරෙහිව මිලිටරිය කඩා පැනීමේ දී පෙන්වූ කඩිනම හා කාර්යක්ෂමතාව සමග එහි වත්මන් ක්‍රියාකලාපය ඔවුහු සංසන්දනය කරමින් කෝපයට පත් ජනයා දැක්වූ අදහස් ද වාර්තා කර තිබේ. තන්ත්‍රයට ප්‍රජාතන්ත්‍රවාදී වහන්තරාවක් දමා ගැනීමේ ප්‍රෝඩාකාරී ප්‍රයත්නයක් වන නව ව්‍යවස්ථාවක් පිලිබඳව සෙනසුරාදා පැවති ජනමත විචාරනය සැලසුම් කර පරිදි පෙරට ගෙන යාම සම්බන්ධයෙන් ද මිලිටරි තන්ත්‍රය විවේචනයට ලක්ව තිබේ.

රැන්ගුන්හි ග්‍රොසරි හිමියෙක් *ඇසෝසියේටඩ් ප්‍රෙස්* ප්‍රවෘත්ති සේවයට මෙසේ පැවසී යː “ආන්ඩුව මිනිසුන් නොමග යැව්වා. පැමිනෙන සුලි සුලඟේ භයානකකම ගැන අපට අනතුරු අඟවන්න පුලුවන්කමක් එයාලට තිබුනා. එහෙනම් අපට ඒකට මීට වඩා හොඳින් සූදානම් වෙන්න තිබුනා.” විශ්‍රාමික සිවිල් සේවකයෙක් මෙසේ හඬ නැගී යː “කෝ සොල්දාදුවොයි පොලීසියයි? ගිය අවුරුද්දෙ වීදිවල විරෝධතා තියෙන කොට නම් ඒගොල්ල බොහොම ඉක්මන් බොහොම ආක්‍රමනශීලියි.”

ජුන්ටාව ජාත්‍යන්තර ආධාර පිලිගැනීම ආරම්භ කර ඇති යන කරුන ම එය මහජන ප්‍රතික්‍රියාව පිලිබඳව නොසන්සුන් භාවයට පත්ව ඇති බවට සලකුනකි. විදේශ ඇමති මේජර් ජෙනරාල් නියාන් වින් සඳුදා විදේශ රාජ්‍යතාන්ත්‍රිකයන්ට මෙසේ පැවසී යː “අපි ආධාර සාදරයෙන් පිලිගන්නවා. අපේ ජනතාව ඉන්නෙ අසීරු තත්වයක.” සහන ඇමති මේජර් ජෙනරාල් මවුං මවුං ස්වේ, හදිසි අවශ්‍යතා වන සෙවිලි ද්‍රව්‍ය, ඖෂධ, ජලය පිරිසිදු කරන පෙති හා මදුරු දැල් ඉල්ලා ඇත. කෙසේ වෙතත්, එමෙන් ම, විදේශ සහන

සේවකයන්ගේ කටයුතු සීමා කිරීමේ දිගට ම යෙදී සිටින මිලිටරිය, දේශපාලන කොන්දේසි හා බැඳුනු ආධාර, විශේෂයෙන් ම එක්සත් ජනපදයෙන් දෙන ආධාර, ප්‍රතික්ෂේප කර තිබේ.

කෙසේ වෙතත්, බුරුම ජුන්ටාව පිලිබඳ බොහෝ ජාත්‍යන්තර විවේචන කුහකත්වයෙන් හා නරුමත්වයෙන් යුක්ත ය. බුරුම තන්ත්‍රයට එරෙහි බුෂ් පාලනාධිකාරයේ පහර ගැසීම් තින්දු කෙරෙන්නේ, කලාපය තුල එක්සත් ජනපදයේ මූලෝපායික අවශ්‍යතා මගිනි. විශේෂයෙන් ම, රට තුල චීනයේ ආනුභාවයට වල කැපීමේ හා වොෂිංටනයට වඩා සහයෝගී විපක්ෂ නායිකා අවුං සාං සු කීගේ නායකත්වයෙන් යුත් ආන්ඩුවක් පිහිටුවීමේ එහි ප්‍රයත්නයන් මගිනි. බුරුම ජනතාව පිලිබඳ උත්සුකතා, හරිකේන් කැත්‍රිනා සුලි කුනාටුවෙන් විපතට පත් ජනයාට සහන සැලසීමෙහි ලා ධවල මන්දිරය දැක් වූ අසමත්කමට කෙලින් ම ප්‍රතිකූලව පිහිටයි.

ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව, ඉන්දියාව හා තායිලන්තය ඇතුලු රටවල් දූසිමක පමන අඩු ගනනේ ජීවිත 220,000ක් බිලිගත් ව්‍යසනකාරී 2004 සුනාමිය සමග වත්මන් ව්‍යසනය සන්සන්දනය කිරීමේ මාධ්‍ය ප්‍රයත්නය ඒක-පාර්ශ්වික හා දේශපාලනිකව මෙහෙයවුනු එකකි. මතකය අහිමි වීමේ සාමූහික ගතිලක්ෂනයක් එම මාධ්‍ය ආවරනය පුරා පැතිර පවතීඃ බුෂ් සහ සෙසු ලෝක නායකයන් දින ගනනාවක් තිස්සේ එම බෙදවාචකය නොතකා සිටි ආකාරය ද ඔවුන් පොරොන්දු වූ ආධාර කෙතරම් සුලු ප්‍රමානයක් යන වග ද මතක් කිරීමට කිසිවෙකුට වත් අවශ්‍ය නැත. විපතට පත් ජනයාගෙන් බොහෝ දෙනෙක් තවමත් මුහුන දෙන දරිද්‍රතාව හා මානසික වේදනාවන් ගැන අවධානය යොමු කිරීමට කිසිවෙකුත් උනන්දු වී නැත.

සුනාමි ව්‍යසනයේ තෙවන සංවත්සරය වෙනුවෙන් පසුගිය දෙසැම්බරයේ දී බීබීසීයේ පල වූ ලිපියක් පෙන්වා දුන් පරිදි, ඉන්දියාවේ අන්දමන් හා නිකොබාර් දූපත්වල 10,000ක් ජනයා තවමත් නිවාස අහිමිව සිටින අතර සීමිත මාසික සලාක මත යැපෙයි. ශ්‍රී ලංකාවේ, දහස් ගනන් සරනගත කඳවුරුවල ඊට සමාන කොන්දේසි යටතේ පසුවෙයි. ඉන්දුනීසියාවේ අසේ පලාතේ, යලි ගොඩනැගීමේ වැඩපිලිවෙල යටතේ නිවාස 20,000ක් තවමත් සම්පූර්න කිරීමට තිබේ. මිනිසුන්ට යලි නිවාස ලබා දී ඇති අවස්ථාවන්හි පවා, බොහෝ දෙනෙකුට සිය ජීවනෝපායන් හා මනා මූලික සේවාවන් අහිමිව පවතී. තුන් වසරකටත් වඩා ගතවීමෙන් පසුවත්, ඉන්දියානු සාගර කලාපය සඳහා පොරොන්දු වූ සුනාමි අනතුරු ඇඟවීමේ පද්ධතිය තවමත් පූර්නව අත්හදා බැලීමට ලක් කොට ක්‍රියාත්මක කිරීමට තිබේ.

අටුවාකරුවන් ගනනාවක් ම, 2004 දී ඉන්දුනීසියානු ආන්ඩුවේ ප්‍රතිචාරය වගකීම පිලිබඳ ආදර්ශයක් ලෙස හුවා දක්වා එයට හුරේ දමමින්, ජාත්‍යන්තර ආධාරවලට සීමා පැනවීම සම්බන්ධයෙන් බුරුම ජුන්ටාවට බැන වැදී ඇත. ලේඛකයන් යලිත් පහසුවෙන් ම නොතකා ඇති කාරනාව නම්, මිලිටරිය බෙදුම්වාදී ගරිල්ලා ව්‍යාපාරයට එරෙහිව දුෂ්ට මර්දනකාරී යුද්ධයක් ගෙන යමින් සිටි අසේ පලාතට ඇතුලුවීමට සහන සේවකයන්ට හා විදේශ මිලිටරි හමුදාවන්ට ඉඩ දීමෙහි ලා ජාකර්තා පාලනය ද එලෙස ම මැලිකමක් දැක්වූ බව යි. සුනාමියෙන් විපතට පත් ජනයා සම්බන්ධයෙන් යම් හෝ උත්සුකතාවක් පෙන්නුම් කරනවා වෙනුවට, ඉන්දුනීසියානු මිලිටරිය අවස්ථාව ඩැහැ ගත්තේ සිය ආක්‍රමනකාරී මෙහෙයුම් ඉදිරියට ගෙන යනු පිනිස ය.

2004 දෙසැම්බරයේ දී ශ්‍රී ලංකාවේ. ඉන්දුනීසියාවේ හා ඉන්දියාවේ ආන්ඩු මෙන් ම, සුලි සුලඟින් විපතට පත් ජනයාගේ ඉරනම සම්බන්ධයෙන් රුදුරු ලෙස නොතැකීම ගැන බුරුම තන්ත්‍රය වරදකරුවකු බවට කිසිදු සැකයක් නැත. කෙසේ වෙතත්, මානුෂික උත්සුකතා පිලිබඳ ඔවුන්ගේ සියලු කියාපෑම් තිබිය දී ම, සිය දල දේශීය නිෂ්පාදිතයන්ට සාපේක්ෂව සොච්චම් ආධාර ප්‍රමානයක් සපයන ආසියාවේ හා ලෝකයේ සෙසු පසුගාමී කලාපවල ස්වභාවික ව්‍යසනයන් ස්වකීය දේශපාලන අරමුනු වෙනුවෙන් ක්ෂමා විරහිත ලෙස ගසා කන එක්සත් ජනපදය හා සෙසු මහ බලවතුන් සම්බන්ධයෙන් ගත් කල එය එමෙන් දෙගුනයකින් සත්‍ය වෙයි. මේ වන තෙක් එක්සත් ජනපදය පොරොන්දු වී ඇත්තේ යන්තම් ඩොලර් මිලියන 3ක ආධාර සහ යුරෝපා සංගමය පොරොන්දු වී ඇත්තේ යුරෝ මිලියන 3ක් පමනි යන්න සඳහන් කර ගැනීම ප්‍රමානවත් වේ.

විශාල ප්‍රචාරයක් සහිත එවන් ආධාර මෙහෙයුම්වල අරමුන වන්නේ දුප්පත් ජනයා විඳින වේදනාවන් අවසන් කිරීම නොව, ඒවාට පැලැස්තර දමා පෙර තිබූ මංමුලා සහගත තත්වයට ම ඔවුන් යලි තල්ලු කර දැමීම යි.

© www.wsws.org